At present, we do not have a high-quality scan copy of the O/L past paper for this subject. The version uploaded here is intended solely for educational purposes. Please note that the answers marked on the paper by students may not be accurate.

If you have a quality scanned copy of this past paper, we would greatly appreciate it if you could share it with us. You may send it to our email address: pastpapers.wiki@gmail.com

Thank you for your support! - Team Past Paper Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024 (2025)

| | | |
|---|---|---|
| **ව්‍යවසායකත්ව අධ්‍යයනය** | I, II | පැය තුනයි |
| முயற்சியாண்மைக் கற்கை | I, II | மூன்று மணித்தியாலம் |
| Entrepreneurship Studies | I, II | Three hours |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. රමල් කුඩා කළ සිට තමන් අනිත් පුද්ගලයන් මෙන් නොවන බව පවසමින් වෙනස් දේ කිරීමට ප්‍රිය කරයි. මෙයින් රමල් පෙන්නුම් කරන ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් වන්නේ
   (1) නිර්මාණශීලීත්වයයි.
   (2) ස්වාධීනත්වයයි.
   (3) අවදානම් භාර ගැනීමයි.
   (4) සුභවාදීවීමයි.

2. රාජා ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කර, ව්‍යාපාරික අවස්ථාවක් හඳුනාගෙන, එහි මුදල් ආයෝජනය කර, ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සිහින දකිමින් සිටී. මෙම ප්‍රකාශයට අනුව රාජාට අවශ්‍ය වන්නේ
   (1) සමාජයීය ව්‍යවසායකයකු වීමට ය.
   (2) ව්‍යාපාරික ව්‍යවසායකයකු වීමට ය.
   (3) අභ්‍යන්තර ව්‍යවසායකයකු වීමට ය.
   (4) ආයතනික ව්‍යවසායකයකු වීමට ය.

3. සුපුන් තම ව්‍යාපාරයෙන් උපයන ලාභය ආයෝජන අවස්ථා කිහිපයක යෙදවීමට අපේක්ෂා කරයි. මේ තුළින් සුපුන් තුළ පෙන්නුම් කෙරෙන ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් වන්නේ
   (1) අවදානම් භාර ගැනීමයි.
   (2) නවෝත්පාදනයයි.
   (3) නම්‍යශීලීත්වයයි.
   (4) ස්වාධීනත්වයයි.

4. සුභානි කුඩා අවන්හලක් පවත්වාගෙන යන අතර ඇය එය දිවා කාලයේ දී පමණක් විවෘතව තබයි. මෙහි දී සුභානිගේ නිර්මාණශීලීත්වයට එරෙහි බාධාවක් වී ඇත්තේ
   (1) වැරදි හා විවේචන සඳහා ඇති බියයි.
   (2) නීති, රෙගුලාසි හා සම්ප්‍රදායන් අනවබෝධයෙන් පිළිපැදීමයි.
   (3) තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීමයි.
   (4) විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ඇලී සිටීමයි.

5. දැවමය උළුවහු ප්ලාස්ටික් උළුවහු ලෙස නවීකරණය වී ඇත. මෙය සැලකිය හැක්කේ
   (1) ආදේශ කිරීමක් ලෙස ය.
   (2) සම්බන්ධ කිරීමක් ලෙස ය.
   (3) නැවත සකස් කිරීමක් ලෙස ය.
   (4) එකතු කිරීමක් ලෙස ය.

6. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම තුළින්
   (1) පාරිභෝගික ආකර්ෂණ වියදම අඩු වේ.
   (2) පාරිභෝගික ආකර්ෂණ වියදම වැඩි වේ.
   (3) නව ගනුදෙනුකරුවන් පිරිසක් නිර්මාණය වේ.
   (4) වෙළෙඳපොළ අධ්‍යයනය කිරීම සඳහා වන වියදම වැඩි වේ.

7. ව්‍යාපාර අදහස් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ව්‍යාපාර අදහස් සුලභ නොවේ.
   (2) ව්‍යාපාර අදහස් විවෘත නොවේ.
   (3) සෑම ව්‍යාපාර අදහසම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි වේ.
   (4) විවිධ මූලාශ්‍ර තුළින් බොහෝ ව්‍යාපාර අදහස් ජනනය කළ හැකි වේ.

[ දෙවැනි පිටුව බලන්න

8. සුපුන් සති පොළෙහි සහල් විකිණීමේ යෙදී සිටියි. සහල් හිඟය හා මිල වැඩිවීම නිසා බොහෝ සහල් වෙළෙඳුන් සති පොළට නොපැමිණීම සුපුන්ගේ සහල් ව්‍යාපාරයට
   (1) ශක්තියකි.
   (2) අවස්ථාවකි.
   (3) දුර්වලතාවකි.
   (4) තර්ජනයකි.

9. රටක් තුළ වැඩිහිටි ජනගහනය වැඩිවීම, ළමුන් සඳහා වන නිෂ්පාදිතවල නිරතවන ව්‍යාපාරවලට තර්ජනයකි. මෙය අයත් වන්නේ
   (1) ආසන්න පරිසරයට ය.
   (2) ප්‍රජා පරිසරයට ය.
   (3) සමාජයීය පරිසරයට ය.
   (4) විද්‍යාත්මක හා තාක්ෂණ පරිසරයට ය.

10. කුඩා පරිමාණ ව්‍යාපාර පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) කුඩා පරිමාණ ව්‍යාපාරවලට නිර්මාණශීලී කුසලතා පහසුවෙන් භාවිත කළ නොහැකි ය.
   (2) කුඩා ව්‍යාපාරවල වෙළෙඳ කටයුතු බොහෝවිට විශාල ප්‍රදේශයක පැතිර පවතී.
   (3) බොහෝ සාර්ථක මහාපරිමාණ ව්‍යාපාර ආරම්භ කර ඇත්තේ කුඩා පරිමාණ ව්‍යාපාර ලෙස ය.
   (4) කුඩා ව්‍යාපාර සඳහා වෙළෙඳපොළ හිදැස හඳුනාගැනීම මගින් ව්‍යාපාර අවස්ථාවලට පිවිසීම අපහසු ය.

11. සඳුන් පාරිභෝගිකයින්ට අවශ්‍ය තොරතුරු සපයමින් සාධාරණ මිලට තම භාණ්ඩ අලෙවි කරයි. මෙයින් පෙන්නුම් කරන්නේ ඔහු සතු
   (1) උපදේශන කුසලතාවයි.
   (2) සන්නිවේදන කුසලතාවයි.
   (3) ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතාවයි.
   (4) සංකල්පනාත්මක කුසලතාවයි.

12. කසුන් අත්කම් ආශ්‍රිත නිර්මාණ පදනම් කරගෙන ග්‍රාමීය ජනතාවගේ ශ්‍රමය ලබා ගනිමින් ව්‍යාපාරයක් ආරම්භ කරයි. මේ තුළින් රටක ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ
   (1) ප්‍රයෝජනයට නොගත් හැකියා ප්‍රයෝජනයට ගත හැකිවීම ය.
   (2) සමාජයීය සුභසාධනයට දායක විය හැකිවීම ය.
   (3) කාර්යයන්හි විවිධත්වයක් ඇති කරගත හැකිවීම ය.
   (4) දේශීය සම්පත් උපයෝජනය කිරීමට හැකිවීම ය.

13. සරත් කිතුල්පිටි භාවිත කර බටර්, බිස් වැනි නවෝත්පාදනයන් සිදුකර, වෙළෙඳපොළ තුළ අලෙවි කිරීම සිදු කරයි. මෙහි දී ඔහුගේ නවෝත්පාදනය සිදු වූ ආකාරය වන්නේ
   (1) නව සොයා ගැනීමක් ලෙස ය.
   (2) දිගුවක් ලෙස ය.
   (3) අනුකරණයක් ලෙස ය.
   (4) සංකලනයක් ලෙස ය.

14. භාණ්ඩවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) ගබඩා කළ හැකි වීම
   (2) අස්පෘශ්‍යවීම
   (3) සමජාතීය බව ආරක්ෂා කළ නොහැකිවීම
   (4) සපයන්නාගෙන් වෙන් කළ නොහැකිවීම

15. 'රජය විසින් මෝටර් වාහන ආනයනය කිරීම මත අයකරන බදු අනුපාත ඉහළ නැංවීම මෝටර් වාහන කර්මාන්තයේ යෙදී සිටින ව්‍යාපාරිකයින්ට තර්ජනයකි.' මෙය අයත් වන්නේ
   (1) ආසන්න පරිසරයට ය.
   (2) දේශපාලන සහ නෛතික පරිසරයට ය.
   (3) සමාජ සහ සංස්කෘතික පරිසරයට ය.
   (4) ආර්ථික පරිසරයට ය.

16. ව්‍යවසායකයකු සිය ව්‍යාපාරය අන්තර්ජාතික වෙළෙඳපොළට පුළුල් කිරීමේ අවස්ථා හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය කරනු ලබන පරිසරය කුමක් ද?
   (1) ආර්ථික පරිසරය
   (2) ගෝලීය පරිසරය
   (3) දේශපාලනික හා නෛතික පරිසරය
   (4) ආසන්න පරිසරය

17. ව්‍යවසායකයකුට තම නව සොයා ගැනීමක් සඳහා නෛතික රැකවරණයක් ලබාගත හැකි වන්නේ
   (1) පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමෙනි.
   (2) වෙළෙඳනාම පිළිබඳ බලපත්‍රයක් ලබා ගැනීමෙනි.
   (3) කාර්මික නිර්මාණ පිළිබඳ බලපත්‍රයක් ලබාගැනීමෙනි.
   (4) සංස්ථාපන සහතිකයක් ලබා ගැනීමෙනි.

18. වර්තමාන ශ්‍රී ලංකාවේ ද්විතීයික අංශයට අයත් ව්‍යාපාරයක් වන්නේ
   (1) බෑග් නිෂ්පාදනය කිරීම ය.
   (2) සුරතල් මසුන් ඇති කිරීම ය.
   (3) සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම ය.
   (4) මැණික් ගැරීම ය.

19. ව්‍යාපාරයක් සමස්තයක් ලෙස සලකා බලමින්, ඊට අවශ්‍ය තීරණ ගැනීමට හා සුදුසු උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යවසායකයෙකුට හැකි වන්නේ ඔහු සතු
   (1) තාක්ෂණික කුසලතාව නිසා ය.
   (2) මානව කුසලතාව නිසා ය.
   (3) සංකල්පනාත්මක කුසලතාව නිසා ය.
   (4) සන්නිවේදන කුසලතාව නිසා ය.

[ තුන්වැනි පිටුව බලන්න

20. ව්‍යවසායකයකුගේ කාර්යයන් වන අවදානම් දැරීම සහ සම්පත් නිසි ලෙස භාවිත කිරීම අයත් වන්නේ පිළිවෙළින්
(1) අයිතිකරුගේ හා කළමනාකරුගේ භූමිකාවලට ය.
(2) අයිතිකරුගේ හා නායකයාගේ භූමිකාවලට ය.
(3) කළමනාකරුගේ හා නායකයාගේ භූමිකාවලට ය.
(4) නායකයාගේ හා අයිතිකරුගේ භූමිකාවලට ය.

21. ව්‍යවසායකයකු අයිතිකරු භූමිකාව ඉටු කරමින් කරනු ලබන කාර්යයක් වන්නේ
(1) ව්‍යාපාර සැලසුම සකස් කිරීම ය.
(2) ව්‍යාපාර කටයුතු සංවිධානය කිරීම ය.
(3) ව්‍යාපාරයේ සේවකයින් මෙහෙයවීම ය.
(4) ව්‍යාපාරයට අවශ්‍ය වත්කම් මිල දී ගැනීම ය.

22. එළවළු වගා කර, විකිණීමේ ව්‍යාපාරයකට ශක්තියක් වන්නේ කුමක් ද?
(1) සේවකයින් හොඳින් වැඩ කිරීම
(2) එළවළු පාරිභෝගිකයින් වැඩිවීම
(3) එළවළු ගොවීන් සඳහා රජය සහනාධාර ලබාදීම
(4) ගංවතුර නිසා බොහෝ එළවළු ගොවියන්ගේ අස්වැන්න අඩුවීම

23. කාන්තාවන් පෙර පාසල් සේවය, දිවා සුරැකුම් සේවය වැනි ව්‍යාපාර බහුල වශයෙන් ආරම්භ කරනු ලබන්නේ
(1) කාන්තාවන්ට ඕනෑ ම කාර්යයක් පහසුවෙන් කළ හැකි නිසා ය.
(2) කාන්තා ශ්‍රම පිරිවැය අඩු නිසා ය.
(3) කාන්තාවන් තුළ පවතින මෘදු ගුණය නිසා ය.
(4) කාන්තාවන් අතර විරැකියාව බහුල නිසා ය.

24. සුදත්, පොල් භාවිත කර අපනයනය කිරීම සඳහා නව භාණ්ඩයක් නිෂ්පාදනය කර ඇත. ඔහු මෙම භාණ්ඩය පිළිබඳ තත්ත්ව පරීක්ෂාවක් කරවා ගත යුතු වන්නේ
(1) කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ය.
(2) කාර්මික තාක්ෂණ ආයතනයෙන් ය.
(3) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ය.
(4) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ය.

25. වර්තමාන ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය චාරිකා සංවිධානය කරන්නන් වැඩිවීමට ප්‍රධානත ම හේතුවක් වන්නේ
(1) ජනතාවට විනෝදය ලබාදීමට අවශ්‍යවීම ය.
(2) අඩු අවදානමක් සහ සුළු ආයෝජනයකින් ආරම්භ කළ හැකිවීම ය.
(3) පවුලේ සාමාජිකයින් සහ හිතවතුන් වැඩි වශයෙන් සහභාගී කරගත හැකිවීම ය.
(4) රජය මගින් ලබා දෙන මූල්‍යමය සහ මූල්‍ය නොවන දිරිගැන්වීම වැඩි කිරීම ය.

26. ව්‍යාපාරයක සමාජයීය වගකීම සම්බන්ධයෙන් සම්ප්‍රදායික මතය වන්නේ, ව්‍යාපාරය විසින්
(1) එහි අයිතිකරුවන්ට උපරිම ප්‍රතිලාභයක් ලබා දිය යුතු බවයි.
(2) පරිසරයේ සියලු ම දේ ආරක්ෂා කළ යුතු බවයි.
(3) රටේ සංවර්ධනයට දායක විය යුතු බවයි.
(4) රටේ සමාජ සහ සංස්කෘතික සංවර්ධනයක් ඇති කළ යුතු බවයි.

27. සිසිල්, නිසිකලට තම ව්‍යාපාරයේ සේවකයින් සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වයි. මේ තුළින් ඔහු ඉටු කරනු ලබන්නේ
(1) ආර්ථික වගකීමකි.
(2) නීතිමය වගකීමකි.
(3) සදාචාරාත්මක වගකීමකි.
(4) පරාර්ථකාමී වගකීමකි.

28. මිනිස් අවශ්‍යතා සහ උවමනා ඉටුකරන ඕනෑ ම ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ
(1) සමාජ සුබසාධනය සැපයීම යි.
(2) ලාභ ඉපයීමයි.
(3) සීමිත සම්පත් භාවිතයයි.
(4) ව්‍යාපාරය ලියාපදිංචි කිරීමයි.

29. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී, අරමුණ ලෙස සලකනු ලබන්නේ කුමක් ද?
(1) ඉටුකරනු ලබන අවශ්‍යතා සහ වුවමනා
(2) සපයනු ලබන භාණ්ඩ හෝ සේවා
(3) ඉදිරි දැක්ම
(4) ලාභ ඉපයීම

30. 'සුහද සංචාරකයෝ' නමින් කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන රහල්ට කළ **නොහැකි** වන්නේ
(1) ව්‍යාපාරය සඳහා තනිව ම මුදල් ආයෝජනය කිරීම ය.
(2) ව්‍යාපාරයේ ලාභය තනිව භුක්ති විඳීම ය.
(3) තම අභිමතය පරිදි ව්‍යාපාර තීරණ ගැනීම ය.
(4) 'සුහද සංචාරකයෝ' නමින් වත්කම් මිල දී ගැනීම ය.

**31.** සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලබන අනෙකුත් සංස්ථාපිත සමාගම්වලින් සීමාසහිත පෞද්ගලික සමාගම වෙනස් වන්නේ

(1) පැවැත්මෙන් ය.
(2) කොටස් නිකුත් කිරීමෙන් ය.
(3) නීතිමය පුද්ගලභාවයෙන් ය.
(4) කළමනාකරණයෙන් ය.

**32.** හවුල් ව්‍යාපාර සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
(2) හවුල් ව්‍යාපාරවලට අඛණ්ඩ පැවැත්මක් නැත.
(3) හවුල් ව්‍යාපාරවල උපරිම හවුල්කරුවන් සංඛ්‍යාවේ සීමාවක් නොමැත.
(4) සෑම හවුල් ව්‍යාපාරයක ම ලිඛිත හවුල් ගිවිසුමක් නොමැත.

**33.** යෝජිත ව්‍යාපාරයක අලෙවි සැලැස්මෙහි ඇතුළත් ස්ථාවර වත්කමක් වන්නේ

(1) කම්හල් ගොඩනැගිල්ල ය.
(2) කාර්යාල ලී බඩු ය.
(3) බෙදාහැරීමේ වෑන් රථ ය.
(4) කම්හල් යන්ත්‍ර සහ උපකරණ ය.

**34.** චානකගේ අපේක්ෂිත ව්‍යාපාරයේ ආරම්භ කිරීමට පෙර වියදමක් වන්නේ

(1) සේවකයන් දෙදෙනකු බඳවා ගැනීම ය.
(2) කාර්යාලයට පරිගණකයක් මිල දී ගැනීම ය.
(3) ව්‍යාපාරය සඳහා ගොඩනැගිල්ලක් මිල දී ගැනීම ය.
(4) ව්‍යාපාර ගොඩනැගිල්ලට ජල පහසුකම් ලබා ගැනීම ය.

**35.** ව්‍යාපාර සැලැස්මක, පරිපාලන සැලැස්මෙහි ඇතුළත් වියදමක් වන්නේ

(1) කම්හල් සේවක වැටුප් ය.
(2) කාර්යාල සේවක වැටුප් ය.
(3) වෙළෙඳ සේවක වැටුප් ය.
(4) බෙදාහැරීමේ රථ රියදුරු වැටුප් ය.

**36.** සිමෙන්ති ගල් නිෂ්පාදන ව්‍යාපාරයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා භාවිත **නොකරන්නේ** කුමක් ද?

(1) සිමෙන්ති මිලදී ගැනීම
(2) කම්හල් සේවක වැටුප්
(3) කම්හල් යන්ත්‍ර මිල දී ගැනීම
(4) කම්හල් විදුලි ගාස්තු

**37.** ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී නිෂ්පාදන කළමනාකරුගේ කාර්ය සඳහන් කරනු ලබන්නේ

(1) මූල්‍ය සැලැස්මෙහි ය.
(2) පරිපාලන සැලැස්මෙහි ය.
(3) නිෂ්පාදන සැලැස්මෙහි ය.
(4) විධායක සාරාංශයෙහි ය.

**38.** අලෙවි උපාය මාර්ග තේරීමේ දී සිල්ලර වෙළෙඳසැල් මගින් භාණ්ඩ බෙදාහැරීම අයත් වන්නේ අලෙවි මිශ්‍රයේ විචල්‍යයක් වන

(1) නිෂ්පාදිතයට ය.
(2) මිලට ය.
(3) ස්ථානයට ය.
(4) ප්‍රවර්ධනයට ය.

**39.** යෝජිත ව්‍යාපාරයක අපේක්ෂිත අවසන් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා භාවිත කරන මුදල් ගලා යාමක් වන්නේ

(1) ව්‍යාපාරයට උපකරණ මිලදී ගැනීම ය.
(2) ව්‍යාපාරය ආරම්භක දින උත්සව වියදම් ගෙවීම ය.
(3) ව්‍යාපාරයේ ණය වාරිකය ගෙවීම ය.
(4) ව්‍යාපාරයේ විදුලි බිල ගෙවීම ය.

**40.** පෙර පාසල් දරුවන් සඳහා බෑග් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරන ජයනි විසින් ඇස්තමේන්තු කරන ලද වියදම් කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීම | 20 000 |
| මහන මැෂින් දෙකක් මිල දී ගැනීම | 200 000 |
| රෙදි සහ අනෙකුත් ද්‍රව්‍ය මිල දී ගැනීම | 45 000 |
| රෙදි කැපීමට මේසයක් මිල දී ගැනීම | 30 000 |
| කතුරු දෙකක් මිල දී ගැනීම | 5 000 |

ජයනිගේ යෝජිත ව්‍යාපාරයේ මුළු ස්ථාවර වත්කම

(1) රු. 230 000 කි.
(2) රු. 235 000 කි.
(3) රු. 255 000 කි.
(4) රු. 300 000 කි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

**ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II**
முயற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විශ්ව විද්‍යාල වරම් නොලැබූ සහන් තම පියාගේ බේකරි කටයුතුවලට සහාය දෙමින් සිටියි. පාරිභෝගිකයින්ගේ රුචිකත්වයට අනුව තම බේකරි නිෂ්පාදිත නව හැඩයකින් හා හොඳ ගුණාත්මක බවින් යුතුව සකස් කරන ලෙස සහන් නිතර ම තම පියාට පවසයි. සහන්ගේ මිත්තණිය බිස්කට් වැනි රසකැවිලිවලට ඉතා කැමැත්තක් දැක්වූවද ඇයගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සලකා ඇයට එවැනි ආහාර ලබා දෙන්නේ නැත. තම මිත්තණියට ඉතා ලෙන්ගතු සහන් එවැනි වයෝවෘද්ධ වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වයට ගැළපෙන දේශීය අමුද්‍රව්‍ය යොදා බිස්කට් වර්ගයක් සෑදීමට තීරණය කර, ඒ බව තම පියාට පැවසුවේ ය. සහන්ගේ පියා රු. 300 000 ක මුදලක් සහන්ට ලබා දුන් අතර, ඔහුගේ බේකරි ගොඩනැගිල්ලේ කොටසක් සහ පෝරණුව මේ සඳහා භාවිත කිරීමට ද අවසර දුන්නේ ය. සහන් තම ඉතිරි කිරීමවලින් රු. 200 000 ක් සහ තම පියා ලබා දුන් මුදල් ද යොදවා 'සහන් බිස්කට්' නමින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කළේ ය. බේකරි කටයුතු පිළිබඳ මනා දැනුමක් ඇති තම පියාගේ සහාය ලබා ගැනීමට ද සහන් අපේක්ෂා කරයි. සහන්ට අවශ්‍ය වන්නේ ව්‍යාපාරයේ හිමිකාරිත්වය සහ ලාභය තමාටත් තම පියාටත් තබාගෙන සියලු වෙළෙඳ හා නීතිමය කටයුතු ඔවුන්ගේ 'සහන් බිස්කට්' ව්‍යාපාරය නමින් සිදුකිරීමට ය.

(i) සහන් නිතර ම තම පියාට පවසන දෙයින් පෙන්නුම් කෙරෙන ඔහු තුළ පවතින ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) (අ) සහන්ගේ මෙම ව්‍යාපාර අදහස ඇතිවීමට හේතුව කුමක් ද?
(ආ) සහන්ගේ යෝජිත ව්‍යාපාරයේ ඉලක්ක පාරිභෝගිකයින් කවුද?

(iii) සහන්ගේ යෝජිත ව්‍යාපාරයේ ශක්තීන් **දෙකක්** ලියන්න.

(iv) සහන්ගේ අවශ්‍යතා ඉටුවන පරිදි ඔහුට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහන් කර, එයට හේතුව ලියන්න.

(v) 'සහන් බිස්කට්' ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව සහ වුවමනාව සඳහන් කරන්න.

● සහන්ගේ යෝජිත ව්‍යාපාරය සඳහා සකස් කරන ලද සැලසුමෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම | 250 000 |
| මාසික අමුද්‍රව්‍ය පිරිවැය | 85 000 |
| මාසික සේවක වැටුප් - බේකරි | 45 000 |
| - බෙදාහැරීම | 35 000 |
| ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ගාස්තු | 8 000 |
| මාසික ප්‍රචාරණ වියදම් | 15 000 |
| මාසික බෙදාහැරීමේ රථ කුලී | 20 000 |
| මාසික විදුලි ගාස්තු | 12 000 |
| මාසික විකුණුම් ආදායම | 300 000 |

**අවශ්‍ය වන්නේ:** සහන්ගේ යෝජිත 'සහන් බිස්කට්' ව්‍යාපාරයේ පහත සඳහන් දෑ දැක්වීම.

(vi) මුළු ආයෝජනය

(vii) (අ) ආරම්භ කිරීමට පෙර වියදම් (ආ) මුළු ස්ථාවර වත්කම්

(viii) නිෂ්පාදන සැලැස්මෙන් ලබාගත් වියදම් **දෙකක්**

(ix) මාසික මුළු අලෙවි වියදම

(x) (අ) මුළු මු[illegible] (ල. 02 × 10 = 20 යි)

Downloaded from 'Past Papers Wiki' - Web: www.pastpapers.wiki

2. (i) ව්‍යවසායකත්වය අනෙකුත් නිෂ්පාදන සාධකවලට වඩා වැදගත්වීමට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන වෙළෙඳපොළ තුළ සිදුවන වෙනස්වීම් මත ව්‍යවසායකයින් විසින් හඳුන්වා දී ඇති ව්‍යාපාර **දෙකක්** සඳහන් කරන්න.
(iii) සමාජයීය ව්‍යවසායකයකුගේ කාර්යභාරය නිදසුනක් මගින් පැහැදිලි කරන්න.
(iv) ඕනෑම රටකට ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** ලියන්න.
(v) නිර්මාණශීලීත්වයට ඇති බාධා **දෙකක්** සඳහන් කර, ඒවා අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 02 × 5 = 10 යි)

3. (i) කුඩා පරිමාණ ව්‍යාපාරවල ශක්තීන් **දෙකක්** සහ සීමා **දෙකක්** සඳහන් කරන්න.
(ii) රටක ආර්ථික සංවර්ධනය සඳහා කුඩා පරිමාණ ව්‍යාපාරවලට දායක විය හැකි ආකාර **හතරක්** ලියන්න.
(iii) කුඩා පරිමාණ ව්‍යාපාරිකයකුට ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **හතරක්** ලියන්න.
(iv) ව්‍යවසායකයකු විසින් නායකයාගේ භූමිකාව ඉටු කරමින් තම ව්‍යාපාරය වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන් **දෙකක්** ලියන්න.
(v) ව්‍යවසායකයකුගේ සංකල්පනාත්මක කුසලතා වර්ධනය කර ගැනීමේ ඇති වැදගත්කම නිදසුන් **දෙකක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 02 × 5 = 10 යි)

4. (i) ව්‍යවසායකයකු සහ ව්‍යාපාර පරිසරය අතර පවතින සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) ව්‍යාපාරවලට බලපාන දේශපාලන හා නෛතික පරිසරයෙහි සාධක **දෙකක්** සඳහන් කරන්න.
(iii) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධක **හතරක්** සඳහන් කරන්න.
(iv) වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ලක්ෂණ **හතරක්** ලියන්න.
(v) සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කර සිටින කමල් විසින් සලකා බැලිය යුතු බාහිර පරිසර සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 × 5 = 10 යි)

5. (i) 'සේනක රජයේ රෝහලෙන් බෙහෙත් ලබා ගෙන, රුවන්ගේ පලතුරු වෙළෙඳසැලෙන් පලතුරු මිල දී ගත්තේ ය.' මෙම වගන්තියේ ඇතුළත් ව්‍යාපාර **දෙක** සඳහන් කර, ඒවා හිමිකාරීත්වය අනුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය වෙන වෙන ම ලියන්න.
(ii) ව්‍යවසායකයකුට හිමිකාරීත්වය සහ ලාභය තමාට පමණක් තබා ගත හැකිවන පරිදි ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග **දෙකක්** සඳහන් කරන්න.
(iii) නාමල්ට තම ව්‍යාපාරය 'මිහිරි බොජුන්' නමින් ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි ගාස්තු සමග ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන **දෙක** සඳහන් කරන්න.
(iv) ව්‍යවසායකයකුට තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමෙන් ලබා ගත හැකි වාසි **හතරක්** ලියන්න.
(v) වරලත් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම පිළිබඳ පොදු එකඟතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 × 5 = 10 යි)

6. (i) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම තුළින් විසඳුම් ලබා ගත හැකි ගැටලු **දෙකක්** ලියන්න.
(ii) ව්‍යාපාර ආචාර ධර්ම තීරණය වීමේ දී බලපෑම් ඇතිකරනු ලබන පාර්ශ්ව **දෙකක්** සඳහන් කරන්න.
(iii) ව්‍යවසායකයෙකුට නීතිමය වගකීම ඉටු කළ හැකි ආකාර **දෙකක්** ලියන්න.
(iv) ව්‍යවසායකයකු වීමට කාන්තාවක් තුළ පැවතිය යුතු ශක්තීන් **හතරක්** සඳහන් කරන්න.
(v) රටක ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් ලබාදෙන මූල්‍ය දිරිගැන්වීම් **දෙකක්** සහ මූල්‍ය නොවන දිරිගැන්වීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 × 5 = 10 යි)

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!
...පුව බලන්න.

7. (i) පාසලක් විසින් සකස් කරනු ලබන සැලසුම් වාර්තා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිෂ්පාදන සැලැස්මක ඇතුළත් තොරතුරු **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) නිකිල්ගේ අපේක්ෂිත ව්‍යාපාරයේ පළමු මාසය සඳහා ඇස්තමේන්තුගත වියදම් හා ආදායම් කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය පිරිවැය | 250 000 |
| ශ්‍රමය හා අනෙකුත් නිෂ්පාදන පිරිවැය | 150 000 |
| විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම් | 40 000 |
| පරිපාලන සහ මූල්‍ය වියදම් | 60 000 |
| විකුණුම් ආදායම | 600 000 |

**අවශ්‍ය වන්නේ:**

නිකිල්ගේ ව්‍යාපාරයේ පළමු මාසය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය, මුළු නිෂ්පාදන නොවන පිරිවැය සහ ශුද්ධ ලාභය දැක්වෙන පරිදි අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය පිළියෙල කිරීම (ලකුණු 06 යි)

(මුළු ලකුණු 10 යි)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

www.LOL.LK

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න